

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2013

සමුපකාර සේවක කොමිෂන් සභාව

අංකඃ100 1/1, ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල,

ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,

කොළඹ - 02

දර්ශනය

තෘප්තිමත්
සමුපකාරික මානව සම්පතක් නිර්මාණය
කිරීම

මෙහෙවර

සමුපකාර ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම උදෙසා එම ක්ෂේත්‍රයෙහි
මානව සම්පතෙහි අභිවෘද්ධිය
පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සකස්කිරීම.

කාර්යයන්

- සමුපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීමේදී උසස් කිරීමේදී සහ ඔවුන්ට හිමි පාරිතෝෂික දීමනා ලබාදීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.

- සමුපකාර සමිතිවල තනතුරුවලට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම හා එබදු තනතුරු වලට අදාළ වැටුප් පරිමාණයන් නියම කිරීම.

- සේවක ආරවුල් විසඳීම, අභියාචනා විභාග කිරීම සහ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින සමුපකාර සමිතිවලට එරෙහිව නීතිමය පියවර ගැනීම.

- කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම.

- ස්වකීය සේවකයින් සම්බන්ධයෙන් වූ විනයානුකූල ක්‍රියාමාර්ගයන්හිදී සමුපකාර සමිති විසින් අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය/ක්‍රියාපටිපාටින් තීරණය කිරීම.

- මානව සම්පත් සංවර්ධනය කිරීමේ සාකච්ඡා සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

සමුපකාර සේවක කොමිෂන් සභාව - වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2013

සමුපකාර සේවකයින්ගේ සේවා සුරක්ෂිතතාව සහ ශුභසිද්ධිය උදෙසා සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් 2013 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සියළු කාර්යයන් පිළිබඳ විස්තරාත්මක හා සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත්කිරීම මෙම වාර්තාව මඟින් සිදුකර ඇත.

මූලික වශයෙන් පහත සඳහන් පරිච්ඡේදවලින් සමන්විත වන පරිදි මෙම වාර්තාවෙහි අන්තර්ගතය සකස්කර ඇත.

* **පළමු පරිච්ඡේදය**

  සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා 2013 වර්ෂය තුළ සේවා නියුක්තිය පිළිබඳ කරුණු.

* **දෙවන පරිච්ඡේදය**

  කොමිෂන් සභාවේ විෂය පථයට අයත්, මුදුන් මට්ටමේ සමුපකාර සමිතිවල නාම ලේඛනය හා 2013 වර්ෂය තුළ එම සමිතිවල සේවයේ යෙදී සිටි සේවකයින් පිළිබඳ කරුණු.

* **තුන්වන පරිච්ඡේදය**

  කොමිෂන් සභා කාර්යාලයේ භෞතික හා මූල්‍ය කටයුතු සහ 2013 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් සිදුකරන ලද සමස්ථ කාර්යයන් සමාලෝචනය කිරීම.

පටුන

පිටුව

I. පරිච්ඡේදය

- කොමිෂන් සභාවේ සංයුතිය,පාලන කටයුතු, හා සංවිධාන ව්‍යුහය..... 2-3
- කාර්යමණ්ඩලය හා 2013 වර්ෂයේ සේවා නියුක්තිය..... 3-4

II. පරිච්ඡේදය

- මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා එම සමිතිවල 2013 වර්ෂයේ සේවා නියුක්තිය..... 6-8

III. පරිච්ඡේදය

- 2013 වර්ෂයේ භෞතික හා මූල්‍ය කාර්යඵල සාධනය..... 11-12
- වර්ෂය තුළ කරන ලද සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය..... 13-17

I පරිච්ඡේදය

- කොමිෂන් සභාවේ සංයුතිය, පාලන කටයුතු, හා සංවිධාන ව්‍යුහය

- කාර්ය මණ්ඩලය හා 2013 වර්ෂයේ සේවා නියුක්තිය

සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා පාලන කටයුතු

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 4 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුව සමුපකාර විෂය භාර ඇමතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ. එම සාමාජිකයින් තිදෙනාගෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කරන අතර, එකී සාමාජිකයින් තිදෙනාම තම පත්වීමේ දින සිට අවුරුදු 03 ක කාලසීමාවක් සිය ධූරයන් දැරිය යුතු වේ. එසේ වුවද සාමාජිකයෙකුගේ ඉල්ලා අස්වීම, ඇමතිවරයා විසින් එකී දූරයෙන් ඉවත් කිරීම, මිය යෑම වැනි කරුණු වලදී හිස් වූ පුරප්පාඩුවක් පිරවීමට තුන් අවුරුදු කාලයෙන් ඉතිරිව ඇති කාලයට වෙනත් සුදුසු අයෙකු පත් කිරීමට ඇමතිවරයාට හැකි වේ.

2013 වර්ෂයේ දී කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස නීතීඥ ඩී.එම්. අරුණ කීර්ති දසනායක මහතා කටයුතු කළ අතර, සෙසු සභිකයින් ලෙස නීතීඥ ඩබ්ලිව්.මංජුල විජේවර්ධන මහතා, එම්.ඩබ්ලිව්.එච්.කමල් ජයරත්න මහතා කටයුතු කරන ලදී.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු පත් කළ යුතුය. එකී ලේකම්වරයා මෙම දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා ද වේ.


2006.08.21 දින සිට කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පන්තියේ නිලධාරියකු වන පී.එච්. ආනන්ද මහතා කටයුතු කළේය. 2007.10.16 දින සිට වෙළඳ, අලෙවි සංවර්ධන හා පාරිභෝගික සේවා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට පත් වූ ඒ මහතා එදින සිට 2012.08.05 දින දක්වා මෙම කොමිෂන් සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලීමේ පදනම මත රාජකාරි ඉටු කළේය. 2012.08.06 දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පන්තියේ නිලධාරියකු වන සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩබ්.ඒ.ධම්මික රාජපක්ෂ මහතා කොමිෂන් සභාවේ වැඩ බලන ලේකම් ලෙස කටයුතු කරයි.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයෙහි සෙසු සාමාජිකයින් ඒකාබද්ධ සේවාවන්ගෙන් පත් කරනු ලැබේ.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 12 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වියදම් මහා භාණ්ඩාගාර වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන් කරනු ලබන මුදල් වලින් සිදු කෙරේ. 2013 වර්ෂයේ වැය ශීර්ෂ 302 යටතේ විසර්ජන පනතින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

කාර්ය මණ්ඩලය හා 2013 වර්ෂයේ සේවා නියුක්තිය

සමුපකාර සේවක කොමිෂන් සභා සංවිධාන සැලැස්ම



2013 වර්ෂයේ සේවා නියුක්තිය

තනතුර	අනුමත සංඛ්‍යාව	2013.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ලේකම්	01	01 (වැඩ බලන)	-
ගණකාධිකාරී (නි/ලේකම්-මුදල්)	01	01	-
නීති නිලධාරී	01	-	01
පරිපාලන නිලධාරී (රාජ්‍ය කළමණාකාර සහකාර - අධි ශ්‍රේණිය)	01	01	-
රාජ්‍ය කළමණාකාර සහකාර (I/II/III)	08	06	02
සංවර්ධන නිලධාරී	05	04	01
රියදුරු	03	01	02
කාර්යාල කාර්ය සහායක (I/II/III)	03	02	01
එකතුව	**23**	**16**	**07**

නව පත්වීම් ලැබ පැමිණි නිලධාරීන්

නම	තනතුර	දිනය
එච්. එම්. ආර්. මල්කාන්ති මෙනවිය.	සංවර්ධන නිලධාරී	2013.01.17
එස්. ඊ. එම්. ඩබ්. එස්. ඒකනායක මෙනවිය.	සංවර්ධන නිලධාරී	2013.01.24
බුද්ධිනී වල්දෙනිය මෙනවිය.	සංවර්ධන නිලධාරී	2013.01.24
එච්. ඩී. එම්. ඩී. කුලතුංග මහත්මිය.	සංවර්ධන නිලධාරී	2013.01.31
ඩබ්.කේ.එච්. වෙල්ලාල මහත්මිය.	සංවර්ධන නිලධාරී	2013.07.02
ටී.ඩී. ජගත් රූපසිංහ මහතා	කාර්යාල කාර්ය සහයක III	2013.04.01

ස්ථාන මාරු වී ගිය සහ ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්

නම	තනතුර	ස්ථාන මාරු වී ගිය දිනය	ස්ථාන මාරුවී පැමිණි දිනය
බුද්ධිනී වල්දෙනිය මෙනවිය	සංවර්ධන නිලධාරී	2013.07.17	-
ඒ.එච්.පී. වල්පොල මහතා	රාජ්‍ය කළමනාකරණ සහකාර I	2013.05.02	-
එම්.ඩී.ඒ කුරේ මෙනවිය	රාජ්‍ය කළමනාකරණ සහකාර II	2013.07.15 (ගුරුසේවයට මුදාහැරීම)	-
රුවින්ද ප්‍රභාත් තිලකරත්න මහතා	අනියම් රියදුරු	2013.07.05	-
ටී.ජී.ඩී මංජුල මහතා	රියදුරු II (අ)	2013.08.06	2013.07.05

II පරිච්ඡේදය

- මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා එම සමිති වල 2013 වර්ෂයේ සේවා නියුක්තිය

මුදුන් මට්ටමේ සමුපකාර සමිති

සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අධීක්ෂණයට යටත් වන ජාතික මට්ටමේ සමුපකාර සමිතිවල සිටින සේවකයින්ගේ සේවාවන්ට අදාළ වන කරුණු පිළිබඳව නියාමනය කිරීම මෙම කොමිෂන් සභාවට පැවරී ඇත. සමුපකාර සේවකයින්ගේ සේවා ප්‍රශ්න විසඳීම පමණක් නොව තනතුරු සඳහා, සුදුසුකම් තීරණය කිරීම, වැටුප් ප්‍රතිශෝධනය කිරීම, වැනි කටයුතු ද මෙම කොමිෂන් සභාව මඟින් ඉටුකරනු ලැබේ. මේ හැරෙන්නට අවශ්‍ය අවස්ථාවන්හිදී පළාත්බද සමුපකාර සේවා කොමිෂන් සභාවලට යම් යම් පැහැදිලි කිරීම් හා උපදෙස් ලබාදීම ද ජාතික වශයෙන් පොදු එකඟතාවකින් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් සිදුකිරීමද මෙම කොමිෂන් සභාව මඟින් ඉටු කරනු ලැබේ. පහත සඳහන් සමුපකාර සමිතිවල සේවකයින්ගේ සේවා සම්බන්ධ සියළුම කටයුතු මෙම කොමිෂන් සභාව මඟින් නියාමනය කරනු ලැබේ.

මුදුන් මට්ටමේ සමුපකාර සමිති වල 2013 වර්ෂයේ සේවානියුක්තිය (යාවත්කාලීන වූ)

	සමිතියේ නම	සේවකයින් ගණන
	සමුපකාර සංගම්	
01	සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය	59
02	සී/ස ශ්‍රී ලංකාවේ සණස මහා සංගමය	18
03	සී/ස ශ්‍රී ලංකා පේෂකර්ම සමුපකාර සමිති සංගමය	05
04	සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය	102
05	සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය	03
06	සී/ස ශ්‍රී ලංකා තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය	01
07	සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය	14
08	සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය	162
09	සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය	25
10	සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය	41
11	සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණසේවා සමුපකාර සමිති සංගමය	13
12	සී/ස. ශ්‍රී ලංකා සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය	03

දීප ව්‍යාප්ත ණය දෙන සමිතිය		
13	සී/ස. අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය	601
14	සී/ස. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය.	76
15	සී/ස. දුම්රිය ස්ථානාධිපති හා ලිපිකරු සමුපකාර ණය දෙන සමිතිය	04
16	සී/ස. තැපැල් හා විදුලි සංදේශ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය	35
17	සී/ස. බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සමුපකාර ණය දෙන සමිතිය	01
18	සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය	09
19	සී/ස රජරට විශ්ව විද්‍යාලීය සමුපකාර සමිතිය	06
20	සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය	07
21	සී/ස ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ ණය දෙන සමිතිය	09
22	සී/ස. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය	02
23	සී/ස. සමෘද්ධි සංවර්ධන, කෘෂිකාර්මික සහකාර නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන සමිතිය	05
24	සී/ස. රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සමුපකාර ණය ගනුදෙනු පිළිබඳ සමිතිය	06
25	සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී ස.ණ.ස.	11
26	සී/ස. දුම්රිය මාර්ග වැඩ දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය	01
27	සී/ස වරාය අධිකාරිය සේවක සමුපකාර බැංකුව	18
28	සී/ස. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය	34
29	සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරිකිරීම් සමුපකාර ණය දෙන සමිතිය	23
30	සී/ස. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය	02
31	සී/ස. ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සමුපකාර ණය දෙන සමිතිය	02
32	සී/ස. ශ්‍රී ලංකාවේ කාන්තා සංවර්ධන සේවා සමුපකාර සමිතිය	42
33	සී/ස. මහජන බැංකු සේවක සමුපකාර ණය දෙන සමිතිය	05
34	සී/ස. කොළඹ මහාරෝගාශාලීය සේවක ස.ණ.ස	10
35	සී/ස. ලංගම සේවක සකසුරුවම් හා සුබසාධක සමුපකාර සමිතිය	06
36	සී/ස. රාජ්‍ය සේවා සමුපකාර ණයදීමේ හා ඉතිරිකිරීමේ සමිතිය.	32
37	සී/ස. ස.තො.ස සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය	04
38	සී/ස. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සුභසාධක ස.ණ.ස	19

39	සී/ස. ශ්‍රී ලංකා මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සමුපකාර ස	07
40	සී/ස. වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය	01
41	සී/ස. සමුපකාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන සමිතිය	07
වෙනත් සමිති		
42	සී/ස. සමස්ත ලංකා සුළු හා මධ්‍යම පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය	01
43	සී/ස. ශ්‍රී ලංකා වානේ කර්මාන්ත සමුපකාර සමිතිය	08
44	සී/ස. සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය	07
45	සී/ස. මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය	14
46	සී/ස. සමස්ත ලංකා විචිත්‍ර පැළැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය	12

III පරිච්ඡේදය

- 2013 වර්ෂයේ ක්‍රියාකාරකම් සාරාංශය හා මූල්‍ය කාර්යඵල සාධනය
- වර්ෂය තුළ කරන ලද සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය

2013 වර්ෂයේ ක්‍රියාකාරකම්වල සාරාංශය

1. උපදෙස් ලබා දීම		-	21
2. විස්තර ඉල්ලා යවා ඇති ලිපි, ච.ලේ. පිටපත් , ලිපි ගොනු ඉල්ලා එවා ඇති ලිපි ඇතුළු වෙනත් ක්‍රියා කළ ලිපි		-	123
3. අනුමත කිරීම් බඳවා ගැනීම් සම්බන්ධව එවා ඇති ක්‍රියා කළ ලිපි		-	21
4. නඩු කටයුතු සම්බන්ධව ක්‍රියා කරන ලද ලිපි		-	08
5. පැමිණිලි සහ අභියාචනා සම්බන්ධ ක්‍රියා කළ ලිපි		-	275
6. නඩු ගණන	කොමිෂන් සභාව සාක්ෂිකරු කළ	-	16
	කොමිෂන් සභාවට විරුද්ධව පැමිණි	-	01

2013 වර්ෂයේ කරන ලද කාර්යය සමාලෝචනය

2013 වර්ෂය තුළ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් වූ පැමිණිලි 500 ක් විභාග කර විසඳුම් ලබාදීමට සැලසුම් කළ අතර 2013 දෙසැම්බර් 31 දින විට එවැනි පැමිණිලි 465 ක් සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කර ඇත.

සමුපකාර සේවකයන් හා සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට කොමිෂන් සභාවේ කටයුතු හා කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කළයුතු ආකාරය පිළිබඳවත් කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති සමුපකාර සේවක ආයතන සංග්‍රහය අනුව සමුපකාර සේවකයින්ට හිමිවන අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිබඳවත් දැනුවත් කිරීම සඳහා 2013 වර්ෂය තුළ වැඩමුළු 16 පැවැත්වීමට සැලසුම් කළ අතර 2013 දෙසැම්බර් 31 දින වන විට එවැනි වැඩමුළු 14 ක් පවත්වා ඇත. මෙයින් වැඩමුළු 06 ක් පවත්වන ලද්දේ 2013 දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව අම්පාර, මඩකළපුව, ත්‍රිකුණාමලය හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල සමුපකාර සේවකයන් සඳහාය.

දැයට කිරුළ (2013) ට සමගාමීව පැවැත් වූ වැඩමුළු

	වැඩමුළු පැවැත්වූ ස්ථානය	වැඩමුළු පැවැත්වූ දිනය	සහභාගි වූ ගණන
01	පොළොන්නරුව	2013.01.29	50
02	ත්‍රිකුණාමලය	2013.01.30	51
03	මඩකලපුව	2013.01.31	48
04	අම්පාර	2013.02.01	60
05	කල්මුනේ	2013.03.27	55
06	අක්කරෙයි පත්තු	2013.03.28	37

2013 දැයට කිරුළ අපගේ ප්‍රදර්ශන කුටියෙන්











චිත්‍ර තරඟයේ
සහ දැනුම
මිනුම තරඟයේ
අවස්ථා





මීට අමතරව සමුපකාර සමිතිවල සේවකයින් සඳහා වැඩමුළු 08 ක් පවත්වන ලදී.

සමුපකාර සේවකයන්ට අදාළ නීතිමය ප්‍රශ්නවලදී අධිකරණයට සහය වීමත් කොමිෂන් සභාව වගඋත්තරකරු ලෙස නම්කර ඇති නඩු කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහය වීමත් මෙම කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයකි. එවැනි නඩු 11ක් සඳහා 2013 දී පෙනීසිටීමට සැලසුම් කළ නමුත් 2013 දෙසැම්බර් 31 දින වන විට එවැනි නඩු කටයුතු 17 ක් සඳහා කොමිෂන් සභාව වෙනුවෙන් නිලධාරීන් පෙනීසිට ඇත.

නඩු අංකය	පැමිණිල්ල	විත්තිය	2013.12.31 දිනට තත්ත්වය
3267,3275,3276, 3277,3278,3279, 3280,3281,3284	සී/ස කම්මල්පත්තු විවිධ සේවා සමුපකාර සමිතිය විසින් සේවයෙන් ඉවත් කළ සේවක පිරිසක්	සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය. (කොමිෂන් සභාව සාක්ෂි සඳහා කැඳවා තිබුණි.)	මාරවිල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වේ.
3265,3266,3269, 3270,3271,3273, 3274	එම	සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය. (කොමිෂන් සභාව සාක්ෂි සඳහා කැඳවා තිබුණි.)	කොමිෂන් සභා තීරණය බල ගන්වා තීන්දුව දී ඇත. ඊට එරෙහිව සමිතිය විසින් අභියාචනා කර ඇත.
18686	සී/ස. ලංගම සේවක සකසුරුවම් හා සුබසාධක සමුපකාර සමිතිය	එස්. මාරසිංහ	සමතයකට පත් වී ඇත.

කොමිෂන් සභාවේ නිලධාරීන්ට කාර්යක්ෂම ලෙස රාජකාරී ඉටුකළ හැකිවන පරිදි පුහුණු වැඩමුළු සඳහා යොමු කිරීමද 2013 වර්ෂයේදී සැලසුම් කළ කාර්යයකි. කොමිෂන් සභාවට පත්කරන ලද උපාධිධාරී සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතන විසින් සංවිධානය කළ පුහුණු වැඩමුළු 03ක් සඳහා එම නිලධාරීන් සහභාගි වූ අතර, මිලෝදා ආයතනය විසින් පවත්වන ලද සිගාස් වැඩසටහන පිළිබඳ පුහුණු වැඩමුළු 01 ක් සඳහා නිලධාරීන් සහභාගි කරවන ලදී.

	නිලධාරියාගේ නම	තනතුර	පාඨමාලාවේ නම	දිනය	වියදම
01	ආර්.ඒ.සී.කේ රණතුංග මයා	කළමනාකරණ සහකාර	Payroll Management	2013.02.11	12 000
02	එච්.එම්.ඒ. හෙන්නායක මිය	කළමනාකරණ සහකාර	වැටුප් පරිවර්තනය	2013.07.18 - 2013.07.19	-
03	එන්. උඩුවාවලගේ මිය				
04	එච්.එම්.ආර්. මල්කාන්ති මෙය	සංවර්ධන නිලධාරී	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	2013.07.23 - 2013.07.24	-
05	එස්.ඊ.එම්.ඩබ්.එස් ඒකනායක මෙය				
06	එච්.ඩී.එම්.ඩී කුලතුංග මිය	සංවර්ධන නිලධාරී	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	2013.08.01 - 2013.08.02	-

* ඉහත කාර්යයන්ට අමතරව 2013 වර්ෂයේ කොමිෂන් සභාව විසින් ඉටුකළ විශේෂ කාර්යයන්

1) 1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනත සමුපකාර ක්ෂේත්‍රයේ වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම සඳහා කෙටුම්පතක් සකස්කර, ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත්කර ඇත.

2) සමුපකාර සේවකයන් සඳහා ඒකීය විනය කාර්ය පටිපාටියක් නොමැති වීම නිසා සේවකයන් මෙන්ම සමුපකාර සමිතිද විවිධ ගැටළුවලට මුහුණ දෙන බව නිරීක්ෂණය කළ සමුපකාර සේවක කොමිෂන් සභාව, විනය කාර්ය පටිපාටියක් සකස්කිරීම සඳහා කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව විසින් මේ වන විට විනය කාර්ය සංග්‍රහය සකස් කර ඇති අතර එය මුද්‍රණ කටයුතු සඳහා මුද්‍රණාලයට යවා ඇත.


එසේම විනය පරීක්ෂණ නිලධාරි සංචිතය හා අභියාචනා පරීක්ෂණ නිලධාරි සංචිතය පත් කිරීම සඳහා මේ වන විට කටයුතු කර අවසන් කර ඇත.

3) සමුපකාර සේවකයන් සඳහා 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද 2007/5 දරණ වැටුප් චක්‍රලේඛනය ද වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර මේ වන විට සමිතිවලින් අදාළ විස්තර කැඳවමින් පවතී.


4) සමුපකාර සේවක කොමිෂන් සභාවේ මහජනතාවට හා අනෙකුත් රාජ්‍ය ආයතන වලට වඩාත් හොඳින් සන්නිවේදනය කිරීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව කලක සිට පැවති අතර, මේ වන විට එම වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කටයුතු අවසන් කර ඇත.

ඉහත කාර්යයන් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන හා ඒ සඳහා 2013 වර්ෂයේදී දරන ලද වියදම්


	ක්‍රියාකාරකම	අයවැය ප්‍රතිපාදන	2013.12.31 දිනට වියදම	ඉතිරිය
01	සේවක අභියාචනා විභාග කිරීම.	-	-	-
02	නීති උපදේශන සේවා	-	-	-
03	සමුපකාර සේවකයන් දැනුවත් කිරීමේ හා කාර්යමණ්ඩල පුහුණු වැඩසටහන් සඳහා	500,000.00	4,52,547.50	47,452.50
04	විනය කාර්ය පටිපාටිය සකස් කිරීම	100,000.00	-	100,000.00
05	2007/05 චක්‍රලේඛය සංශෝධනය කිරීම	50,000.00	-	50,000.00
06	වෙබ් අඩවියක් නිර්මාණය කිරීම	60,000.00	60,000.00	-



	2012	2013
වැටුප්	4,895,864.46	5,312,353.88
ගමන් වියදම්	278,908.00	294,018.50
සැපයීම් සේවා	750,071.76	923,261.19
නඩත්තු වියදම්	679,887.52	920,314.32
ගිවිසුම්ගත සේවා	3,087,133.69	2,893,620.13
මාරුකිරීම්	24,438.95	23,617.43



	2012	2013
පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	49082.00	442321.00
ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	322650.00	210850.00
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	410060.00	-



	2012	2013
1 වන කාරතුව	2,732,742.75	2426763.99
2 වන කාරතුව	2,479,785.01	2456616.45
3 වන කාරතුව	2,684,977.00	2514412.45
4 වන කාරතුව	2,600,591.62	3622563.56

2014 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති

පහත සඳහන් ව්‍යාපෘති 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව විසින් සැලසුම් කර ඇත.

	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති කාලසීමාව	ඇස්තමේන්තු මුදල	අරමුදල් ප්‍රභවය	අරමුණු
01	2014 දැයට කිරුළ ප්‍රදර්ශන කුටියක් ප්‍රතිසංවිධානය කිරීම හා සමුපකාර ව්‍යාපෘති පිළිබඳ දැනුම මිනුම තරඟයක් පැවැත්වීම, වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කිරීම.	2014 පෙබරවාරි 04-10	රු.620,000	අයවැය ප්‍රතිපාදන	සමුපකාර ව්‍යාපාරය හා කොමිෂන් සභාවේ කටයුතුද පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
02	සමුපකාර නීතිය හා විනය ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු 16 ක් පැවැත්වීම. (මෙයින් වැඩමුළු 06ක් දැයට කිරුළ සංවර්ධන වැඩපිළිවෙල යටතේ කෑගල්ල හා කුරුණෑගල දිස්ත්‍රික්කවල පැවැත්විය)	2014 ජනවාරි-දෙසැම්බර්	රු.600,000	අයවැය ප්‍රතිපාදන	සමුපකාර ව්‍යාපාරය හා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
03	විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කිරීම.	2014 ජනවාරි-ජූනි	රු.100,000	අයවැය ප්‍රතිපාදන	සමුපකාර ක්ෂේත්‍රයේ සේවානියුක්තිකයන්ගේ ජීවන තත්වය උසස්කිරීම.
04	කොමිෂන් සභා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.	2014 ජනවාරි-දෙසැම්බර්	රු.100,000	අයවැය ප්‍රතිපාදන	කොමිෂන් සභා කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

2013 වර්ෂය තුළ තනතුරු සඳහා බඳවා ගැනීම්

	සමුපකාර සමිතියේ නම	**තනතුර**	**සංඛ්‍යාව**
01.	සී/ස. සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරීන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය	සහකාර ගණකාධිකාරි	01
02.	සී/ස ශ්‍රී ලංකා ග්‍රාමීය බැංකු මහ සංගමය	කාර්යාල කාර්ය සහයක	01
03.	සී/ස ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය	සාමාන්‍යාධිකාරි	01
04.	සී/ස ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය	ව්‍යාපෘති කළමනාකරු	01
05.	සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය	කළමනාකරණ සහකාර	04
06.	සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය	කළමනාකරණ සහකාර	24
07.	සී/ස පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය	සාමාන්‍යාධිකාරි	01
08.	සී/ස. අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය	සහකාර සාමාන්‍යාධිකාර	08
09.	සී/ස. අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය	ගණකාධිකාරණ සහකාර	05
10.	සී/ස ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය	සාමාන්‍යාධිකාරි	01
11.	සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය	පරිගණක ක්‍රියාකරු	02
12.	සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය	සහකාර ගණකාධිකාරි	04
13.	සී/ස. ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය	අභ්‍යන්තර විගණක	01
14.	සී/ස. ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය	ගබඩා පාලක	01
15.	සී/ස. තැපැල් ටෙලිකොම් සේවක සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය	නිවාඩු නිකේතන කාමර සේවක	01
16.	සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය	සාමාන්‍යාධිකාරි	01
17.	සී/ස. රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය	කළමනාකරණ සහකාර	01
18.	සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය	උපදේශක	01
19.	සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර	ගණකාධිකාරි	01

	සකසුරුවම් සහ ණය දෙන සමිතිය		
20.	සී/ස පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය	රියදුරු	01
21.	සී/ස පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය	කළමනාකරණ සහකාර	01
22.	සී/ස පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය	සාමාන්‍යාධිකාරී	01
23.	සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය	අයකැමි	10

2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම

අනුව අපේක්ෂිත වැඩසටහන් සහ අවසන් කර ඇති වැඩසටහන්

වැඩ සටහන	අපේක්ෂිත ඉලක්කය	අවසන් කර ඇති ප්‍රමාණය	වෙනස		වෙනසට හේතු
			අඩු	වැඩි	
සමුපකාර සමිති සේවකයින් හා අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කිරීමේ වැඩමුළු	16	14	02		
අභියාචනා සහ පැමිණිලි විභාග කිරීම	500	448	52		අභියාචනා සහ පැමිණිලි වල තොරතුරු අසම්පූර්ණ වීම
කොමිෂන් සභාවට විරුද්ධව ගොනු කර ඇති නඩු/ සාක්ෂිකරු කර ඇති නඩු/ කොමිෂන් සභාව විසින් පවරා ඇති නඩු	11	17		06	
කාර්යාල නිලධාරීන් පුහුණු කිරීම්	10	06	04		